# ලංසු සඳහා ආරාධනයයි

**කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP)**

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

## ධාන්‍ය රනිල කුලයට අයත් බෝග සහ තෙල් බෝග වගාව (Oil Crops) තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති (Sprinkler Blade Type Irrigation Systems) සැපයීම, බෙදා හැරීම සහ ස්ථාපනය කිරීම.

**ලංසු අංකය: SARP/G/NCB/OC/2026/772**

1. ශ්‍රී ලංකාව වෙත ජාත්‍යන්තර කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අරමුදලෙන් (IFAD) ණය මුදලක් ලබාගෙන ඇති අතර, එම ණය ලැබීම්වලින් කොටසක් SARP ව්‍යාපෘතිය හරහා ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් යටතේ කුරුණෑගල, පුත්තලම, අනුරාධපුර, වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්කවල තෝරා ගත් ප්‍රතිලාභීන් සඳහා ධාන්‍ය රනිල කුලයට අයත් බෝග සහ තෙල් බෝග වගාවට සහාය වීම සඳහා බ්ලේඩ් වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති සැපයීම, බෙදා හැරීම සහ ස්ථාපනය කිරීම සඳහා යෙදවීමට අදහස් කරයි.

2. SARP ව්‍යාපෘතිය, තෙල් බෝග වගාව සඳහා තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති සැපයීම, බෙදා හැරීම සහ ස්ථාපනය කිරීම සඳහා සුදුසුකම් ලත් ලංසු කරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. කාණ්ඩ අංකය , අයිතම නාමය, අවශ්‍ය ප්‍රමාණයක් සහ අනුරූප ලංසු සුරක්ෂණයේ වටිනාකම ආදී තොරතුරු පහත වගුවෙහි දැක්වේ.

| කාණ්ඩ අංකය | අයිතම විස්තරය | ප්‍රමාණය | ලංසු සුරක්ෂණයේ වටිනාකම (රුපියල්) |
|---|---|---|---|
| A | කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති ( 1 කණ්ඩායම) (Blade Type Sprinkler Irrigation Systems) | 500 | 1,070,000.00 |
| B | කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති (2 කණ්ඩායම) | 400 | 855,000.00 |
| C | පුත්තලම දිස්ත්‍රික්කය සඳහා තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති | 350 | 750,000.00 |
| D | අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති ( 1 කණ්ඩායම) | 400 | 855,000.00 |
| E | අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති ( 2 කණ්ඩායම) | 400 | 855,000.00 |
| F | වව්නියාව දිස්ත්‍රික්කය සඳහා තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති | 500 | 1,070,000.00 |
| G | මන්නාරම දිස්ත්‍රික්කය සඳහා තල වර්ගයේ ඉසින වාරිමාර්ග පද්ධති | 450 | 962,000.00 |

3. ප්‍රතිචාර දැක්වීමට සහ ලංසු ලේඛනයේ දක්වා ඇති සීමාවන්ට අනුගතවීමට කැමති සියළුම යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන් සඳහා මෙම ලංසු ආරාධනාව විවෘත වේ. තවද මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු SARP ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන අංශයෙන් ලබා ගත හැක. කාර්යාල වේලාව තුළදී, පහත දැක්වෙන ලිපිනයැති ස්ථානයේදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලයේදී ගාස්තු ගෙවීමකින්තොරව ලංසු ලිපි ලේඛන පරික්ෂා කොට බැලිය හැක.

4. ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටිය (NCB) යටතේ **ලංසු** මෙහෙයවන/කැඳවන අතර www.ifad.org/project-procurement වෙබ් අඩවියෙහි ලබා දී ඇති IFAD ප්‍රසම්පාදන අත්පොතට අනුකූලව මෙම ලංසු ලිපිලේඛනයන්හි ඇගයීමේ පටිපාටිය විස්තරකොට ඇත. NCB ක්‍රියාවලියෙහි විස්තර කොට ඇති පරිදි කොන්ත්‍රාත් ප්‍රදානයට පෙර නිර්දේශයන් පරික්ෂා කර බැලීම, සුදුසුකම් හා පෙර කාර්යසාධන සමාලෝචනය සහ සත්‍යාපනය කිරීම ඇතුළත් වේ.

5. ලංසු ඉදිරිපත් කිරීමට කැමති ලංසුකරුවන් රු. 20,000/= ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවා ලංසු ලේඛනය මිලදී ගත යුතුය.

6. පහත දැක්වෙන ලිපිනයට, ලංසුකරුගේ සම්පූර්ණ තොරතුරු සහිතව විද්‍යුත් ලිපියක් හෝ ලිපියක් එවීමෙන්ද ලංසු ලිපි ලේඛන ලබා ගත හැක. ලංසු ලේඛන ලබා ගැනීම සඳහා මුදල්ගෙවීම, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP) අයත්වන **කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත ලංකා බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ ගිණුම් අංක 7040662, වෙත කෙරෙන බැංකු ගණුදෙනුවක් මගින් සිදු කළ හැකි අතර SARP ව්‍යාපෘතිය වෙත පැමිණිමෙන් ද එහි ගණකාධිකරී අංශය වෙත මුදල් ගෙවිය හැකියාව ඇත.**

7. ලංසු දත්ත පත්‍රිකාවෙහි , ලංසුකරුවන්ට උපදෙස් 23.1 හි නිශ්චිතව දක්වා ඇති ආකාරයට සහ එහි සඳහන් කර ඇති ලිපිනයට 2026 මාර්තු මස 12 දින පෙ.ව. 11.00 ට පෙර ලංසු ගෙනවිත් භාරදිය යුතු අතර එදින පෙ.ව.11.15 ට ලංසු විවෘත කරනු ලැබේ. ඉලෙක්ට්‍රෝනික් ලංසු පිළිනොගන්නා බව කාරුණාවෙන් සැළකිය යුතුය.

8. කිසිඳු තත්වයක් යටතේ ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගන්නා බවත්, එවැනි ප්‍රමාද වී ලැබෙන ලංසු විවෘත නොකරම ආපසු හරවා එවන බවත්, ඒවායෙහි පිරිවැය ලංසුකරු විසින්ම දැරිය යුතු බවත් සියළුම ලංසුකරුවන් දැනගත යුතුය. තවද සියළුම ලංසු සමග ඉහත වගුවේ දක්වා ඇති පරිදි ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය.

9. ලිපිනය


**ව්‍යාපෘති අධ්‍යක්ෂ**

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP)

**නොම්මර 2/2/1, කන්දවත්ත පාර, පැලවත්ත, බත්තරමුල්ල.**

**දුරකථන: 011 2770998 විද්‍යුත් තැපැල: Procurementsarp@gmail.com**